ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2000 අංක 52 දරන දහම් පාසල් අරමුදල පනත

[සහතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2000 අගෝස්තු මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 3.50 යි.

2000 අංක 52 දරන දහම් පාසල් අරමුදල පනත

[සහතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 18 වන දින]

එල්. ඩී.–ඕ. 70/98.

"දහම් පාසල් අරමුදල" නමින් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවීම සඳහා ද ශ්‍රී ලංකාවෙහි දහම් පාසල් ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම පිණිස අරමුදල් එකතු කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2000 අංක 52 දරන දහම් පාසල් අරමුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "දහම් පාසල් අරමුදල" නම් වූ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. දහම් පාසල් අරමුදල පිහිටුවීම.

(2) (1) වන උපවගන්තිය මගින් අරමුදලට ලබා දී ඇති නාමයෙන් එය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර ඒ නාමයෙන් අරමුදලට විරුද්ධව ද, අරමුදල විසින් ද නඩු පැවරිය හැකි ය.

3. (1) අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු අතර, ඒ මණ්ඩලය මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට සංස්ථාපනය විය යුතු ය. අරමුදලේ කළමනාකරණ මණ්ඩලය.

(2) අරමුදලේ කටයුතු පරිපාලනය කිරීමේ, කළමනාකරණය කිරීමේ සහ පාලනය කිරීමේ කාර්යය සඳහා මේ පනත මගින් අරමුදලට පවරා දී ඇති හෝ පනවා ඇති හෝ ලබා දී ඇති බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉෂ්ට කිරීම සහ ඉටු කිරීම ද මණ්ඩලය විසින් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ විධිවිධානවලට යටත්ව මණ්ඩලයේ රැස්වීම්වලට අදාළ කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වලදී කරනු ලබන කටයුතු සම්බන්ධයෙන් රීති සෑදීමේ බලය මණ්ඩලයට තිබිය යුතු ය.

මණ්ඩලයේ සංයුතිය.

4. (1) මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :–

(අ) ජනරජයේ ජනාධිපතිවරයා හෝ ජනාධිපතිවරයා විසින් නම් කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙක් ;

(ආ) පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකවරයා හෝ ඔහුගේ නාමිකයෙක් ;

(ඇ) බුද්ධ ශාසන විෂය භාර අමාත්‍යවරයා ;

(ඈ) බුද්ධ ශාසන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඉ) මහා භාරකාරවරයා ;

(ඊ) බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්වරයා ; සහ

(උ) බෞද්ධ කටයුතු සහ අධ්‍යාපනය ගැන පළපුරුද්ද ඇති පුද්ගලයන් අතුරෙන් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් දෙදෙනෙක්.

(2) (1) වන උපවගන්තියේ (උ) ඡේදය යටතේ පත් කරනු ලබන මණ්ඩලයේ සාමාජිකයෙක් (3) වන සහ (4) වන උප වගන්තිවල විධිවිධානවලට යටත්ව ජනාධිපතිවරයා විසින් තමා වෙත නිකුත් කරන ලද පත්වීම් ලිපියෙහි නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා ධුර දැරිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (උ) ඡේදය යටතේ පත් කරන ලද මණ්ඩලයේ සාමාජිකයෙක් ජනාධිපතිවරයා විසින් හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තියේ (උ) ඡේදය යටතේ පත් කරන ලද මණ්ඩලයේ සාමාජිකයෙක් තත් කාර්ය සඳහා ජනාධිපතිවරයා අමතන ලද ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ලිපිය ජනාධිපතිවරයා විසින් ලිඛිතව භාර ගත් දිනයේ සිට එම ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ (උ) ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු මියයෑම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා ඒ වෙනුවට පත් කරනු ලබන යම් තැනැත්තෙක් තමා අනුප්‍රාප්තිකයා වන සාමාජිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(6) මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබීම හේතුව නිසාම හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ දී සිදු වූ යම් දෝෂයක් නිසාම හෝ මණ්ඩලයේ යම් කටයුත්තක් හෝ ක්‍රියාවක් බලරහිත නොවිය යුතු ය.

(7) ජනාධිපතිවරයා හෝ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ජනාධිපතිවරයා විසින් නම් කරන ලද තැනැත්තා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය.

5. (1) මණ්ඩලයට පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත උපදේශක කමිටුවක් තිබිය යුතු ය :– උපදේශක කමිටුව.

(අ) සියම් නිකායේ මල්වතු පාර්ශ්වයේ මහානායක ස්ථවිරයන් විසින් නම් කරනු ලබන අනුනායක ස්ථවිර;

(ආ) සියම් නිකායේ අස්ගිරි පාර්ශ්වයේ මහානායක ස්ථවිරයන් විසින් නම් කරනු ලබන අනුනායක ස්ථවිර ;

(ඇ) ශ්‍රී ලංකා අමරපුර සංඝ සභාවේ තත් කාලයේ සභාපතිවරයා වශයෙන් ධුරය දරන මහානායක ස්ථවිරයන් විසින් නම් කරනු ලබන උපසභාපති ස්ථවිර ;

(ඈ) ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ මහානායක ස්ථවිරයන් විසින් නම් කරන ලද අනුනායක ස්ථවිර ;

(ඉ) බෞද්ධ කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇති පුද්ගලයන් අතුරින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් පස් දෙනෙක්.

(2) (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) ඡේදවල සඳහන් ස්ථවිරයන් විසින් ඔවුන් අතුරින් එක් තැනැත්තකු උපදේශක කමිටුවේ සභාපතිවරයා ලෙස තෝරා පත් කර ගනු ලැබිය යුතු ය. එසේ තෝරා පත් කර ගනු ලබන ස්ථවිරයන්, තමා තෝරා පත් කර ගනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා සභාපතිවරයා ලෙස ධුරය දැරිය යුතු අතර, නැවත තෝරා පත් කර ගැනිම සඳහා ඔහු සුදුස්සකු විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ පත් කරන ලද උපදේශක කමිටුවේ සාමාජිකයෙක් මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන්, කලින් ධුරය අත්හළහොත් මිස, තමා පත් කරනු ලැබූ දින සිට අවුරුදු දෙකක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ පත් කරන ලද උපදේශක කමිටුවේ සාමාජිකයෙක් ජනාධිපතිවරයා විසින් හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ පත් කරන ලද උපදේශක කමිටුවේ යම් සාමාජිකයෙක් තත් කාර්ය සඳහා ජනාධිපතිවරයා අමතනු ලබන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ජනාධිපතිවරයා විසින් ලිඛිතව එම ඉල්ලා අස්වීම භාර ගනු ලබන දින සිට එම ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(6) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ පත් කරන ලද යම් සාමාජිකයකු මිය යෑම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරිම නිසා ඒ වෙනුවට පත් කරනු ලබන යම් තැනැත්තෙක් තම අනුප්‍රාප්තිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

උපදේශක කමිටුව මණ්ඩලයට උපදෙස් දීම සහ සහායදීම කළ යුතු බව.

6. මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය සහ කර්තව්‍ය කිරිම හා ඉටු කිරිම සම්බන්ධයෙන් කිසියම් කරුණක් සඳහා කමිටුවේ උපදෙස් සහ සහාය ලබා ගැනීම සඳහා මණ්ඩලය විසින් කමිටුව වෙත යොමු කරනු ලැබූ විට උපදේශක කමිටුව විසින් මණ්ඩලයට සහාය දීම සහ උපදෙස් දීම කළ යුතු ය.

අරමුදලේ අරමුණු.

7. අරමුදලේ අරමුණු වනුයේ, දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් මුදල් භාර ගැනිම සහ ශ්‍රී ලංකාවේ දහම් පාසල් ආරක්ෂා කිරිම සහ පෝෂණය කිරීම සඳහා ඉතා යෝග්‍ය යයි මණ්ඩලය සලකන ආකාරයට සහ එම කාර්ය සඳහා එම මුදල් භාවිත කිරිම වේ.

8. අරමුදලට පහත සඳහන් බලතල තිබිය යුතු ය :– අරමුදලේ බලතල.

(අ) ත්‍යාගයක්, පරිත්‍යාගයක්, තෙස්තමේන්තු තියාදනයකින් හෝ අන්‍යාකාරයකින් අරමුදලට ලැබුණු යම් නිශ්චල හෝ චංචල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ දීම ;

(ආ) අරමුදලට අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක් විකිණීම, උකස් කිරීම, බද්දට දීම, මාරුකිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඇ) අරමුදලේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ආධාර, පරිත්‍යාග සහ ප්‍රදාන ලබා දීම ;

(ඈ) අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සියලු කොන්ත්‍රාත් හා ගිවිසුම්වලට කෙලින්ම හෝ මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා ලිඛිතව බලය පවරන ලද නිලධරයන්ගේ හෝ නියෝජිතයන්ගේ මාර්ගයෙන් එම ගිවිසුම්වලට ඇතුළත් වී ඒවා ක්‍රියාත්මක කිරීම ;

(ඉ) දහම් පාසල් ආරක්ෂා කිරීමේ සහ පෝෂණය කිරීමේ යෙදී සිටින ආයතනවලට උදව් කිරීම ;

(ඊ) අරමුදලේ පාලනයට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් රීති සෑදීම ;

(උ) අරමුදලේ දේපළ ඇපයට තබා හෝ ඇපයක් නොමැතිව මුදල් ණයට ගැනීම හෝ මුදල් ලබාගැනීම ; සහ

(ඌ) අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආනුෂංගික හෝ උපකාරීවන සියලු ක්‍රියා සහ දේ ඉටු කිරීම.

9. "දහම් පාසල් අරමුදල් ගිණුම" යනුවෙන් සඳහන් කරන ලද ගිණුමක් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වා ගෙන යා යුතු අතර එම අරමුදලට පහත සඳහන් මුදල් බැර කරනු ලැබිය යුතු ය :– දහම් පාසල් අරමුදල් ගිණුම.

(අ) දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් ප්‍රදාන හෝ පරිත්‍යාග වශයෙන් අරමුදලට ලැබෙන සියලු මුදල් ; සහ

(ආ) අරමුදල මගින් සිදුකර ඇති ආයෝජනවලින් ලැබෙන මුදල්.

ගිණුමෙන් මුදල් ගෙවීම.

10. දහම් පාසල් අරමුදල් ගිණුමෙන් පහත සඳහන් මුදල් ගෙවනු ලැබිය යුතු ය :–

(අ) මණ්ඩලය විසින් අනුමත කරන ලද අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය සියලු මුදල් ;

(ආ) අරමුදලේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ වැටුප් සහ වෙනත් වේතන ගෙවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් සහ විගණකාධිපතිවරයාට ගෙවිය යුතු පාරිශ්‍රමිකය සඳහා අවශ්‍ය මුදල්.

අරමුදලේ මුදල් ආයෝජනය කිරීම.

11. අරමුදලට අයත් ඕනෑම මුදලක් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයට ආයෝජනය කරනු ලැබිය හැකි ය.

අරමුදලේ නිලධරයන් සහ සේවකයන්.

12. අරමුදලට පහත සඳහන් බලතල තිබිය යුතු ය :–

(අ) අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන් පත් කිරීම ; සහ

(ආ) එම නිලධරයන්ට සහ සේවකයන්ට ගෙවනු ලබන පාරිශ්‍රමික තීරණය කිරීම.

ගිණුම් සහ විගණනය.

13. (1) අරමුදලේ ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු සම්බන්ධයෙන් නිසි පරිදි ගිණුම් තැබීමට මණ්ඩලය කටයුතු සැලැස්විය යුතු ය.

(2) සෑම වර්ෂයකම විගණකාධිපතිවරයා විසින් අරමුදලේ ගිණුම් විගණනය කළ යුතු ය. එම ගිණුම් විගණනය කිරීමේ දී ඔහුට සහාය වීමේ කාර්ය සඳහා විගණකාධිපතිවරයා විසින් සුදුසුකම් ලත් විගණකවරයකුගේ සේවය ලබා ගත හැකි අතර එම තැනැත්තා විගණකාධිපතිවරයාගේ විධාන සහ පාලනය යටතේ කටයුතු කළ යුතු ය.

(3) අරමුදලේ ගිණුම් විගණනය කිරීමේ දී විගණකාධිපතිවරයා විසින් දරන ලද වියදම් පියවීමේ කාර්ය සඳහා අරමුදලේ ආදායමෙන් විගණකාධිපතිවරයාට මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය යුතු ය. විගණකාධිපතිවරයා වෙත අරමුදලින් ගෙවන ලද යම් පාරිශ්‍රමිකයකින් එම විගණනය පැවැත්වීමේ කාර්ය සඳහා ඔහු විසින් යම් සුදුසුකම් ලත් විගණකවරයකුට හෝ විගණකවරයන්ට ගෙවන ලද සියලු මුදල් අඩු කර ගැනීමෙන් පසු ඉතිරි මුදල රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(4) සෑම වර්ෂයකම දෙසැම්බර් මස 31 වන දිනට පසු හැකි ඉක්මනින් විගණකාධිපතිවරයා විසින් එම වර්ෂය සඳහා අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම පිළිබඳ වාර්තාවක් පිළියෙල කළ යුතු අතර, එම වාර්තාව සමග අරමුදලේ ආදායම සහ වියදම පිළිබඳ ප්‍රකාශයක් ද එම වර්ෂය තුළ දී අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම සම්බන්ධයෙන් වූ වාර්තාවක් ද ඉදිරිපත් කළ යුතු ය.

(5) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන් —

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙක් වීමෙන් හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වීමෙන් ගණකාධිකාරිවරයකු ලෙස කටයුතු කිරීමට එම ආයතනවල සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ යම් පුද්ගලයෙක් ; හෝ

(ආ) එක් එක් නේවාසික කොටස්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයකු වීමෙන් හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වීමෙන් ගණකාධිකාරිවරයකු ලෙස කටයුතු කිරීම සඳහා එම ආයතනවල සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ සාමාජිකයන් සිටින වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයක්,

හස් වේ.

විගණකාධිපති වරයාගේ ප්‍රකාශය සහ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බව.

14. 13 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් සකස් කරන ලද වාර්තාව ඔහු විසින් බුද්ධ ශාසන විෂයය භාර අමාත්‍යවරයා වෙත යැවිය යුතු අතර, එම අමාත්‍යවරයා විසින් එම වාර්තාව සහ ප්‍රකාශය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

අරමුදලේ නිලධරයන් සහ සේවකයන් රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

15. අරමුදලේ සියලු නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව අරමුදල උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

16. අරමුදල අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

ඇතැම් බදුවලින් නිදහස් කිරීම.

17. යම් තැනැත්තකු විසින් මුදලින් හෝ අන්‍යාකාරයකින් අරමුදලට කරනු ලබන පරිත්‍යාගයක් 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා රජය විසින් පිහිටුවන ලද අරමුදලකට මුදලින් හෝ අන්‍යාකාරයකින් කරන ලද පරිත්‍යාගයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

නඩුවලින් ආරක්ෂාව.

18. මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය යටතේ අරමුදල විසින් හෝ යම් සාමාජිකයකු විසින් හෝ නිලධරයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සඳහා අරමුදලට හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ අරමුදලේ යම් නිලධරයකුට හෝ සේවකයකුට එරෙහිව කිසිම සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

19. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

20. මේ පනතේ පද සම්බන්ධයෙන්, අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස— අර්ථ නිරූපණය.

"ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන්, මුදල් නීති පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ.

"දහම් පාසල" යන්නෙන්, බෞද්ධ ධර්මය ගිහියන්ට ඉගැන්වීම සඳහා අනන්‍ය ලෙස පවත්වා ගෙන යනු ලබන පාසලක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.